**ශ්‍රී ලංකාවේ මුඛ්‍ය ආපදා අවදානම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන්වූ ආපදා අවමකරණය සහ යථාතත්වයට පත් කිරීම සඳහා සහායවීමේ ගෝලීය පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය -2015**

---

ශ්‍රී ලංකාවේ මුඛ්‍ය ආපදා අවදානම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වූ ආපදා අවමකරණය සහ යථාතත්වයට පත් කිරීම සඳහා සහායවීමේ ගෝලීය පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2014 ජූලි 11 දින එළඹි අංක ටීඑෆ් 016699 දරන ප්‍රදාන ගිවිසුමේ සම්මත කොන්දේසිවල 2.07 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන්නේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයයි. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ ඒ යටතේ වූ නියෝජිත ආයතනවල තාක්ෂණික ධාරිතාවය ගොඩනැංවීම සහ ආපදා අවදානම හඳුනාගැනීම සඳහා උචිත ප්‍රතිපත්ති සම්පාදනය සහ මෙහෙයුම් ප්‍රතිචාර තක්සේරු කිරීම, ප්‍රමාණනය කිරීම, අදාල වන ඇල්ම දක්වන පාර්ශවයන් හඳුනා ගැනීම වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වන රු.මිලියන 54.6 කට සමාන එජඩො 420,000 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජුනි 06 දින ආරම්භ කරන ලද අතර 2015 ජුනි 05 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය පසුව 2015 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතිය කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ ඩොලර් ගිණුමේ මූලික අත්තිකාරම සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1** **මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ ඩොලර් ගිණුමේ මූලික අත්තිකාරම සහ ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව. සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත් ය.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**----------------------------------------**

**2.2.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

2016 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 ජුනි 22 දින දීය.

**3.** **මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**---------------------------------**

**3.1** **අරමුදල් උපයෝජනය**

**----------------------**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| ------------- | ------------------------- | | ------------------------- | ---------------------------- | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 420,000 | 54.60 | 52.50 | 87,630 | 12.36 |

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) රේඛීය අමාත්‍යාංශවල වගකීම් වෙනස්වීම හේතුවෙන් ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සඳහන් කළ කාල පරිච්ඡේදය තුළ දේශීය වානිජ බැංකුවක නිල බැංකු ගිණුමක් විවෘත කිරීමට නොහැකිවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදයන් සහිතව 2015 පෙබරවාරි ආරම්භ කර තිබුණි. එම නිසා ව්‍යාපෘතිය රු.මිලියන 54.6 කට සමාන එ.ජ.ඩො. 420,000 ක් වූ මුළු වෙන්කිරීම් වලින් රු.මිලියන 12.36 කට සමාන එ.ජ.ඩො. 87,630 ක්වූ මුදලක් පමණක් 2015 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කර තිබුණි.
ව්‍යාපෘතිය වෙත ලැබී තිබුණු රු.මිලියන 34.09 කට සමාන එ.ජ.ඩො. 240,500 ක් වූ මූලික අත්තිකාරම් මුදලින් රු.මිලියන 21.99 කට සමාන එජඩො 152,870 ක වැය නොකළ ප්‍රදාන මුදල් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර 2016 පෙබරවාරි 03 දින ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙත ආපසු යවා තිබුණි.

(ආ) සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි කාර්තුමය වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතු කර දක්වමින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ අතර එම කටයුතු නියාමනය කිරීම සඳහා යාන්ත්‍රණයක්ද ස්ථාපිත කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගතිය මැනීම සඳහා පාලන උපකරණයක් වශයෙන් සහ ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කරමින් ව්‍යාපෘතියේ නිශ්චිත කාලපරිච්ඡේදය තුළ ප්‍රදාන මුදල් උපයෝජනය කළ හැකි වන ලෙස අදාල සැලැස්ම සහ යාන්ත්‍රණය උපයෝජනය කර නොතිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

ව්‍යාපෘතියේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව, ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ නගරවල ආපදා කළමනාකරණය නායයෑම් අවදානම කළමනාකරණය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම වශයෙන් ව්‍යාපෘතියේ කටයුතු සංරචක 4 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු විය. ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ නගරවල ආපදා කළමනාකරණ අවදානම තක්සේරු කිරීමේ සංවර්ධන කටයුතු සහ පසු අවදානම් අවශ්‍යතා තක්සේරු කිරීම සහ පූර්ව දැනුම්දීමේ පද්ධති යනාදි ආපදා කළමනාකරණයේ මූලික ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සවිස්තරාත්මක පුහුණු වැඩ සටහන්වල සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරික්ෂණය විය.
කෙසේ වෙතත්, 2015 දෙසැම්බර් 15 දින නායයාමේ පූර්ව දැනුම්දීමේ පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් කර තිබුණු අතර රත්නපුර සහ මොණරාගල යන නායයාමේ අවදානම සහිත දිස්ත්‍රික්කවල රු.මිලියන 12.05 ක් වූ පිරිවැයකින් ස්වයංක්‍රිය වර්ෂාමාන 15 ක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ ස්ථාපිත කර තිබුණි.